ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2019
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 තත්ත්වාගණනය කළ මතය
---------------------------

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය,විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලය අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදය අනුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවල ඉඩදෙනු ලබන අවස්ථාවන්හිදී හැර ආදායම් හා වියදම් එකිනෙකට හිළව් නොකළ යුතු නමුත් මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට රු. 211,488 ක් වූ වත්කම් අපහරණය කිරීමෙන් ලද ලාභය විදේශ කාර්යාල පවත්වාගෙන යාමේ වියදම් ගිණුමට හිළව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රවර්ධන අරමුදලින් මිලදී ගත් අයිතමයන් විකිණීමෙන් ලද ලාභය රු.211,488 ක් ප්‍රවර්ධන හා ප්‍රචාරණ අරමුදල යටතේ ගිණුම් ගත කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදය අනුව ආදායම් හා වියදම් එකිනෙකට හිළව් නොකළ යුතුය. |

(ආ)ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

| | | | |
|---|---|---|---|
| i. | මණ්ඩලය විසින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු.81,316,077 ක් වූ රසායනාගාර උපකරණ, ලිබඩු හා සවිකිරීම් සහ කාර්යාල උපකරණ තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද උක්ත ප්‍රමිතය අනුව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර නොතිබුණි. | ප්‍රාදේශීය කාර්යාල හා තේ උපදේශක/ පරික්ෂක කාර්යාල කිහිපයක ප්‍රත්‍යාගණන කටයුතු නිම කළ අතර ඊට අදාළ ගිණුම් ගැලපීම් 2019 වර්ෂයේදී සිදුකරන ලදී. 2020 වර්ෂයේදි සෙසු සියල්ල ප්‍රත්‍යාගණනය කර ගැලපීම් සිදුකිරීමට සටහන් කර ගන්නා ලදී. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| ii. | රු.350,000,000 ක වටිනාකමකට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදුකළ යුතුය. ප්‍රමාද වී හෝ අදාළ ප්‍රත්‍යාගණනය 2020 වර්ෂයේ සිදුකර මූල්‍ය ප්‍රකාශන වල ගැලපුම් කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම ප්‍රත්‍යාගණනය කළයුතුය. |
| iii. | ප්‍රමිතයේ 36 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදි මණ්ඩලය විසින් ලිබඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රධාන කාර්යාලයේ එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2020 වර්ෂයේදි අභ්‍යන්තර කමිටුවක් මගින් ප්‍රධාන කාර්යයාලයෙහි දේපළ පිරියත උපකරණ පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ අතර සියලු වාර්තා කඩිනමින් ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 36 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට එම දේපළ පිරියත උපකරණ පන්තියම ප්‍රත්‍යාගණනය කළයුතුය. |

## 1.5.2. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂය අවසානවනවිට වැඩ නිමකරන ලද බදුරලිය ප්‍රාදේශීය කාර්යාලයේ දෙවන අදියර සඳහා මණ්ඩලය විසින් දරන ලද පිරිවැය රු. 9,401,645 ක් වුවද ඊට අදාළ කෙරී ගෙන යන වැඩ ගිණුමේ රු.13,200,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.මෙම ඉදිකිරීම ප්‍රාග්ධනිත කිරීමටද කටයුතු කර නොතිබුණි. | බදුරලිය ප්‍රාදේශීය කාර්යාලයේ දරන ලද පිරිවැය රු. 9,401,645 කෙරීගෙන යන වැඩ ගිණුමට හර විය යුතු අතර පෙන්වා ඇති ශේෂය වන රු. 13,200,000 නිවැරදි නොවේ. එය ඇස්තමේන්තුගත වියදමය. මෙම වැරදි සටහන 2020 වර්ෂයේ නිවැරදි කර ඇත. | සමාලෝචිත වර්ෂයේ අවසානයට කොන්ත්‍රාත්තුවේ අවසන්කළ වැඩ වටිනාකම, කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කළයුතුය. |
| (ආ)බදුරලිය ප්‍රාදේශීය කාර්යාලය දෙවන අදියර ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදලක් නොමැති වුවද එම ඉදිකිරීම සඳහා රු.5,601,986 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඇස්තමේන්තුගත පිරිවැය කෙරීගෙන යන වැඩ වටිනාකම ලෙස පෙන්වීම නිසා උද්ගතවන ණයහිමි ශේෂයද නිවැරදි නැත. එයද 2020 වර්ෂයේ නිවැරදි කර ඇත. | සමාලෝචිත වර්ෂය අවසානයට පවත්නා බැදීම් පමණක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කළයුතුය. |
| (ඇ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිමකරන ලද කොන්ත්‍රාත්වල කොන්ත්‍රාත් ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් එකතුව රු.2,160,663 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන තිබුණද වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් ගිණුම ඒ අනුව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් මුදලද ඒ අනුව 2020 වර්ෂයේදී ගැලපීම් කර ඇත. | මණ්ඩලය ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත් පසු එම ගිණුම නිරවුල් කළයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.**199,798,378** ක් ලැබිය යුතු පොලී ලෙස දක්වනු වෙනුවට ස්ථාවර තැන්පතු ආයෝජන ලෙස ගිණුම් ගතකර තිබුණි. | **2020** වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරිමේදී විමසුමේ දක්වා ඇති පරිදි ස්ථාවර තැන්පතු සහ ලැබිය යුතු පොලී අයිතමයන් **2** ක් ලෙස ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු පොලී ආදායම, ලැබිය යුතු පොලී ලෙස ගිණුම්ගත කළයුතුය. |
| (ඉ) ඉදිරි වර්ෂය සඳහා ලද බෙදාහැරීමේ බලපත්‍ර ආදායම හා තේ කර්මාන්තශාලා ලියාපදිංචිය අලුත් කිරීමේ ආදායම එකතුව රු.**2,385,000** ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | **2020** වර්ෂයේ ගිණුම් පිළියෙල කිරිමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | ඉදිරි වර්ෂය සඳහා ලද ආදායම් ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කළයුතුය. |

**1.5.3.** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (අ)රසායනාගාර ආදායම | **11,499,886** | **12,748,400** | **1,248,514** | රසායනාගාර පරීක්ෂණ සඳහා රු.**12,748,400** ක ඉල්ලුම්පත් ලැබී නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) නිර්දේශයට යොමුකර ඇත. ඒ අනුව පරීක්ෂණ සඳහා යොමුකර ඇතතේ රු.**11,499,886** ක ඉල්ලුම්පත් පමණි. ඒ අනුව පරීක්ෂණ සඳහා නිර්දේශ වන මුදල පමණක් මූල්‍ය අංශය මඟින් ලබාගෙන ගිණුම් ගත කර ඇත. | රසායනාගාරයෙහි ආදායම් වාර්තා සහ මූල්‍ය අංශයෙහි ආදායම් වාර්තා සැසඳීමට හැකිවන පරිදි පද්ධතියක් නිර්මාණය කළයුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය අවසාන තොග ගණනයේදී රු.334,162 ක තොගයක් අඩුවෙන් ගණනය වී ඇත. | |
| (ආ)රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය | 6,450,193 | 6,784,355 | 334,162 | මේ අනුව මෙම හිඟ ප්‍රමාණය 2020 වසරේ ජර්නල් මඟින් නිවැරදි කරනු ලැබේ. | භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ශේෂ සමඟ අනුරූපී විය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

**1.6.1 ලැබිය යුතු මුදල්**

----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබියයුතු රු.25,000,000ක් වෙනුවෙන්,ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "සිලෝන් ටී මියුසියම්" හි අයිතිය අත්කර ගෙන එම ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝග අනුව තීරණයකට එළඹ තිබූ නමුත් 2020 මැයි 31 දක්වාම මෙම ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | ජනවසම වෙත ලබා දී ඇති රු.මිලියන 25ක මුදල වෙනුවෙන් "සිලෝන් ටී මියුසියම්"ගොඩනැගිල්ල පවත්වා ගෙන යන ඉඩම පවරා ගැනීම හා ණයශේෂය කපා හැරීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන ඇත. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අදාළ ඉඩම පාවිච්චි කිරීමට අදාළ බදු මුදල හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ජනවසමට ලබාදී ඇති රු.මිලියන 25 ක ණය මුදල සඳහා නාමික පොලියක් ගණනය කර ශේෂ කපා හැරීම හා දේපළ අත්පත් කර ගැනීමට අදාළ ශේෂ ගැලපීම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ කඩිනමින් සිදුකිරීමට ක්‍රියා කරමි. | දෙපාර්ශවය එකඟ වී ඇති පරිදි ණය මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ)හිටපු අමාත්‍යවරයකු, අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරයකු ඇතුළු පිරිසකගේ විදේශ ගමන් | හිටපු අමාත්‍යවරයා සහ ඔහුගේ කාර්යයමණ්ඩලය විදේශ ගමන් සඳහා දරන ලද මුදලකි. එම මුදල ශ්‍රී ලංකා තේ මණ්ඩලයට එවන ලෙස දන්වා ලිපි මඟින් අමාත්‍යාංශය වෙත | විදේශ ගමන් සඳහා බාහිර පාර්ශවයන් |

| | | |
|---|---|---|
| වියදම් එකතුව රු.**975,255** ක් වසර **2** ක කාලයක සිට ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වන නමුත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනුම් දී ඇති අතර එහි ප්‍රගතියක් මේ වන තුරු නොමැත. කෙසේ නමුදු කඩිනමින් මෙම මුදල ගෙන්වා ගැනීමට ක්‍රියා කරමි. | වෙනුවෙන් වැයකළ මෙම මුදල අයකරගත යුතුය. |
| (ඇ)**2017** වර්ෂයේදී ගෝලීය තේ සංග්‍රහය වෙනුවෙන් විදේශ තානාපති කාර්යාල වෙත ලබා දුන් රු. **51,604,457**ක මුදලින් රටවල් **15**කින් ඉතිරි වූ රු.**1,078,054**ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආපසු ගෙන්වාගෙන නොතිබුණි. | ගෝලීය තේ සංග්‍රහය සඳහා විදේශ තානාපති කාර්යාල වෙත ලබාදී ඇති මුදලින් ඉතිරි මුදල පරීක්ෂාකර අදාළ ලේඛන විදේශ සබඳතා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කර ඇති අතර එමඟින් එම අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර ඇති මුදල් කඩිනමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත මුදාහරින බව දැන් වූ අතර මේ පිළිබඳ පසුවිපරම් කරමි. | විශේෂිත කාර්යයන් සඳහා ලබාදුන් මුදලින් ඉතිරි මුදල් කාර්යය අවසන් වූ විගස ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2** ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ **01** සිට වර්ෂ **16** දක්වා කාලයක සිට තේ කම්හල් හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර ඇති රු. **3,204,264** ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් ලැබිය යුතු පාර්ශවයන් පිළිබඳව විමර්ශනයක් සිදු කර ඔවුන්ගේ බිල්පත් සහ දළු සැපයුම්කරුවන්ගේ ලේඛන පරීක්ෂා කර කරුණු නිසි ලෙස තහවුරු වූ පසු එම දළු මුදල් කම්හල පිහිටි ප්‍රාදේශීය කාර්යාලය හරහා ගෙවීමට කටයුතු කරනු ඇත. ඒ අනුව එම ගිණුම් වෙත අලුතින් මුදල් එකතු වීමත් තිබෙන මුදල් ගෙවීමටත් සිදුවේ. යම් යම් අවස්ථාවලදී මුදල් ලැබිය යුත්තන් නිසි පරිදි හඳුනාගැනීමට නොහැකි වීම සහ විවිධ පාර්ශවයන් වරින් වර ඉදිරිපත් කරන ලිපි හේතුකොටගෙන ඇතිවන පරීක්ෂණ සංකීර්ණතා හේතුවෙන් අය කර ගත් මුදල් ගෙවා අවසන් කිරීම වරින් වර කල් ගත වී ඇත. ඒ අනුව නිසි අයඳුම්කරුවන් හඳුනාගැනීම අපොහොසත් වන අවස්ථාවලදී තැන්පත් කරන ලද මුදල් තැන්පත්කරුවන් වෙත නැවත ගෙවීමටත් කටයුතු කරනු ඇත. විසඳුමක් ලබාගත නොහැකි අවස්ථා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට ඉදිරිපත් කර ලැබෙන උපදෙස් අනුව ක්‍රියා කිරීමටත් ගෙවිය හැකි මුදල් කඩිනමින් ගෙවා අවසන් කිරීමටත් මේ වසර තුළදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ගෙවිය යුතු පාර්ශව නිවැරදිව හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)වැඩ අවසන් කළ කොන්ත්‍රාත්වලින් රඳවාගන්නා ලද මුදල් රු.906,611 ක් වසර දෙකක් ඉක්මවා ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්වලින් 2017 වර්ෂය දක්වා වන රැඳවුම් මුදල් මේ වන තුරු ඉල්ලුම්කර නොමැති නිසා 2020 වර්ෂයේදී ආදායමට බැර කිරීමට ක්‍රියාකර ඇත. | අදාළ පාර්ශව හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන්නේනම් ආදායමට බැර කිරීමට පියවර ගත යුතුය. |

**1.7** නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13 හා 14 වගන්ති | පනතේ විධිවිධාන අනුව සෙස් බදු තේ අරමුදලට බැර කළයුතු නමුත් ඊට පටහැනිව මහා භාණ්ඩාගාරය වෙත බැර කර තිබුණි. | ආරම්භයේදී තේ මණ්ඩල පනත යටතේ සඳහන් විධිවිධාන අනුව තේ මණ්ඩලය විසින් සෙස් බදු අයකිරීම සිදුකරන ලද නමුත්, පසුව සම්මත කරන ලද අපනයන සංවර්ධන පනත මඟින් සෙස් බදු අයකිරීම මහ භාණ්ඩාගාරය විසින් පවරා ගෙන ඇත. තේ මණ්ඩල පනතේ අවශ්‍ය සංශෝධන කිරීමට අවශ්‍ය උපදෙස් නිතිපති වරයාගෙන් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. මේ වන තුරු නීති උපදෙස් ලැබී නොමැත. | නීතිපතිවරයාගේ උපදෙස් පරිදි පනත සංශෝධනය කිරීම කර සෙස් බදු සම්බන්ධව පවතින ගැටළුව විසඳා ගත යුතුය. |
| (ආ) 1957 අංක 51 දරන තේ පාලන පනතේ (i) 22 (1) වගන්තිය | ලියාපදිංචි කසළ තේ වෙළෙඳුන් වෙත පමණක් කසළ තේ අවසරපත්‍ර නිකුත් කළ යුතුවුවද 2019 වර්ෂය සඳහා ලියාපදිංචිය අලුත් නොකරන ලද ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයට අයත් සැකසුම් මධ්‍යස්ථාන 05ක් සඳහා කසළ තේ මිලදී ගැනීම සඳහා අවසර පත්‍ර නිකුත් කර තිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩල සාමන්‍ය ක්‍රියා පටිපාටිය වන්නේ පෙර වසරේ ලියාපදිංචි කිරීම සහිත මධ්‍යස්ථාන ලියාපදිංචිය අලුත් කිරීමට අයදුම්පත් ඉදිරිපත් කළ පසු මෙම අයදුම්පත්‍රය පරීක්ෂාකර ලියාපදිංචිය අලුත් කරන තෙක් ප්‍රවාහන බලපත්‍රය නිකුත් කරන අතර අයදුම්පත්‍ර පරීක්ෂණයේදි පවතින අඩුපාඩු පිළිබඳ කරන උපදෙස් විශ්ලේෂණය හා විමර්ශනය අනුව මධ්‍යස්ථාන ලියාපදිංචිය යාවත්කාලීන කිරීම හෝ අත්හිටුවීම තීරණය කරයි. | 1957 අංක 51 දරන තේ පාලන පනතේ 22(1)වගන්තිය අනුව කටයුතු කළයුතුය. |
| (ii)24(2) (ඇ) වගන්තිය | (i)කසළ තේ වලින් වෙන්කරගත් පරිභෝජනයට යෝග්‍ය තේ අලෙවිකිරීම් පිළිබඳ | ප්‍රතික්ෂේපිත තේ සැකසුම් මධ්‍යස්ථානය වෙත ලබාගන්නා ලද ප්‍රතික්ෂේපිත තේ පිළිසැකසුම් කර ලබා ගන්නා කළු තේ කොළඹ තේ | 1957 අංක 51 දරන තේ පාලන පනතේ 24(2)(ඇ)වගන් |

| | | | |
|---|---|---|---|
| | ලබාගත් පිළිගත හැකි ලියවිලි පරීක්ෂණ අවස්ථාවේ ඉදිරිපත් කළ යුතු නමුත් විගණනයේදී සිදුකළ ස්ථානීය පරීක්ෂණ වෙත අලෙවිකිරීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකෙරුණු අතර මේ සම්බන්ධයෙන් තේ මණ්ඩලය අවධානය යොමුකර නොතිබුණි. | වෙන්දේසිය වෙත අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළයුතු බවට නිර්ණායයකයක් නොමැත. මේ හා සම්බන්ධව උපදෙස් ලබාදීමට කටයුතු කරනු ඇත. | තිය අනුව අලෙවි කිරීම් පිළිබඳ තොරතුරු ලබාගැනීමට කටයුතු කළයුතුය. |
| | **(ii)**කසළ තේ සැකසුම්කරුවන් විසින් අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමාසයක් ගතවීමට පෙර පරිභෝජනයට යෝග්‍ය තේ , කසළ තේ වලින් වෙන්කරගැනීම අවසන් කළයුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රතික්ෂේපිත තේ බලපත්‍ර මත ලබාගන්නා ප්‍රතික්ෂේපිත තේ වලින් කළු තේ වෙන්කර ඉතිරි වන රොඩු තේ නැවත භාවිතා කළ නොහැකි වන පරිදිවි-ප්‍රකෘති කිරීම, පොහොර බවට පත්කිරීම සිදුකරන අතර අදාළ සටහන් ලෙජර්වල සටහන් තබා ප්‍රාදේශීය කාර්යාලවෙත ඉදිරිපත් කෙරේ. ඒ අනුව **2019**ඔක්තෝබර්**31** දින කිලෝ ග්‍රෑම් **182,129** ක ප්‍රමාණයක් වි-ප්‍රකෘති කර තිබුණි. | **1957** අංක **51** දරන තේ පාලන පනතේ **24(2)(ඈ)**වගන්තිය අනුව කසළ තේ වලින් පරිභෝජනයට යෝග්‍ය තේ වෙන් කිරීම නියමිත කාලය තුළ සිදුකිරීම පිළිබඳව තේ පරීක්ෂකවරුන් විසින්පරීක්ෂා කළයුතුය. |
| (ඇ) **1971**අංක **38** දරන මුදල් පනතේ **11**වගන්තිය | **2019** දෙසැම්බර් **31** දිනටමණ්ඩලය විසින් රු.**7,780,196,625** ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් එකතු කරනු ලබන ආනයන බදු මුදල නිරතුරුවම තේ මණ්ඩලයට වාසිදායක අයුරින් ලංකා බැංකුවේ ආයෝජනය කරන බැවින් එක් එක් ආයෝජනය සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම ප්‍රායෝගික නොමැති බැවින් එසේ සිදු නොකළ බව සඳහන් කරමි. | **1971** අංක **38** දරන මුදල් පනතේ **11** වගන්තිය අනුව අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ)**2018** සැප්තැම්බර් **21** දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග | මණ්ඩලයේ අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබූ **2009** වර්ෂයේදී රු.**32,132,088** ක් වැයකර මිලදී ගන්නා ලද | අදාළ යන්ත්‍ර මිලදී ගැනීමේදී මණ්ඩලයේ නිලධාරියා අතින් යම් විෂමතාවයක් සිදුවී තිබේ ද යන්න පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම පිණිස **2018** අප්‍රේල්**23** දිනැතිව මූලික විමර්ශන නිලධාරියෙකු පත්කළ අතර ඔහු | අදාළ විමර්ශනය නොපමාව සිදුකර සුදුසු විනය පියවර ගැනීම.මෙවැනි අඩුපාඩු නැවත ඇති නොවීම |

| | | | |
|---|---|---|---|
| | පළිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය වාර්තාවේ දින දක්වා භාවිතා කර නොතිබුණි. වර්ෂ **11**ක් ගතවී තිබුණද වගකිවයුත්තන්ට එරෙහි අභ්‍යන්තර විනය පරීක්ෂණ අවසන්කර නොතිබුණි. | විමර්ශන කටයුතු වලින් **2019** මැයි **23** දින ඉල්ලා අස්විය. ඉන් අනතුරුව **2019** දෙසැම්බර් **20** දිනැතිව නව විමර්ශන නිලධාරියෙකු පත් කරදැනට මූලික විමර්ශන කටයුතු සිදු කරනු ලබයි. | පිණිස විධිවිධාන යෙදීම. |
| (ඉ)**2003** ජුනි **02** දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **9.14** ඡේදය | මණ්ඩලය විසින් මානව සම්පත් කළමනාකරණය සඳහා නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වනතෙක් අත්පොතක් සකස්කර නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මානව සම්පත් කළමණාකරනයට අදාළ නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්යය පටිපාටි අත්පොත කෙටුම්පත් සකස් කරමින් පවතින අතර ඉදිරියේදී අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය. | කාර්ය පටිපාටි අත්පොත කඩිනමින් සකස්කළ යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

--------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**4,229,253**කඅතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තයරු.**43,977,748** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහිරු.**39,748,495** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සංවර්ධන වියදම් සියයට **26.66** කින් සහ පරිපාලන වියදම් සියයට **10.95** කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** අනුපාත විශ්ලේෂණය

----------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාත පිළිවෙලින් **1: 14** හා **1:8** ක ඉහළ අගයක් විය. ප්‍රචාරණ හා ප්‍රවර්ධන අරමුදලේ කෙටිකාලීන ආයෝජන ස්ථාවර තැන්පතු මුළු ජංගම වත්කම් වලින් සියයට **77** ක් නියෝජනය වීම ඊට බලපා තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් සියයට **39** කින් අඩුවීම, සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය ඉහළ අගයක් ගැනීමට හේතු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 අප්‍රේල් මාසය තුළ නුවරඑළිය නගරයේ ක්‍රියාත්මක වූ “නුවරඑළිය වසන්ත උදානය”සැණකෙළි කාලයේ දේශීය හා විදේශීය සංචාරකයින්ගේ අවධානයට ලක්වන පරිදි “Ceylon tea”නාමය ප්‍රචලිත කිරීම වෙනුවෙන් සංගීත සංදර්ශනයක් පැවැත්වීම හා අප්‍රේල් මාසය තුළ නගරය ආලෝකමත් කිරීමේ කාර්යයන් සදහා රු.11,101,750 ක් වැය කර තිබුණි. මෙවැනි වියදම් දැරීම මඟින් තේ කර්මාන්තයට ලැබෙන සෘජු ප්‍රතිලාභ හඳුනාගත නොහැකි හෙයින් මුදල් වැයකිරීමේදී ආර්ථිකමය ,ඵලදායීව හා විචක්ෂණශීලිව කටයුතුකර නොමැතිබව නිරීක්ෂණය විය. එමෙන්ම 2019 මාර්තු 13 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මෙය අනුමත කර තිබුණද මේ සම්බන්ධයෙන් අසතුට පල කර තිබුණි. | ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින්ගෙන් බහුතර ප්‍රමාණයක් අප්‍රේල් මාසය තුළ නුවරඑළිය හා මහනුවර නගරවල සංචාරය කරනු ලබයි. 2018 වර්ෂයේ අප්‍රේල් මාසයේදි සංචාරකයින් 233,000 ක් හා මාර්තු මාසයේදි සංචාරකයින් 180,000 පැමිණ ඇත. ඒ අනුව අප විසින් ඇස්තමේන්තු කරන ලද්දේ 2019 වර්ෂයේදීත් ඒ ආකාරයෙන්ම සංචාරකයින්ගේ පැමිණීම සිදුවන බවය. 2019 වර්ෂයේ මාර්තු මාසයේදී විදේශීය සංචාරකයින් 244,000 හා අප්‍රේල් මාසයේ විදේශීය සංචාරකයින් 167,000 ක් ශ්‍රී ලංකාවට පැමිණ ඇති අතර ඉන් බහුතරයක් නුවරඑළිය නගරය වෙත හා මහනුවර නගරය වෙත පැමිණ ඇත. නුවරඑළිය වසන්ත උදානය මඟින් ලැබුණු ප්‍රතිලාභ එක් වර්ෂයක් තුළදී ගණනය කිරීමට නොහැකි අතර විදේශීය සංචාරකයින් විශාල ප්‍රමාණයක් පැමිණීම හේතුවෙන් වැය කරන ලද මුදලට සාපේක්ෂව එහි සාර්ථකත්වයක් ලැබූ බව විශේෂයෙන්ම සඳහන් කරමි. | ප්‍රවර්ධන වියදම් දැරීමේදී අරමුණ ඉටුකරගත හැකි ප්‍රවර්ධන උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතුය |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)නුවරඑළිය වසන්ත උදාන කාලය තුළ පැවති සංගීත සංදර්ශන වේදිකාව තැනීමේ කොන්ත්‍රාත්තුව **රු.5,250,000** ක් වූ තෙවන අවම මිල ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාතකරු වෙත පිරිනමා තිබුණි.**රු.4,180,000** ක් වූ පළමු අවම මිල ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාතකරු අනෙකුත් සුදුසුකම් සපුරා තිබුණද ලංසු මිල ගණන් දින **60** ක වලංගු කාලපරිච්ඡේදයකට ලැබී නොමැති බව දක්වමින් ප්‍රතික්ෂේප කර තිබුණි.එසේ වුවද මෙම කාර්යය පිරිනැමීම හා කාර්යය සම්පූර්ණ කිරීමේ කාල පරතරය දින **10** ක් පමණක් බව නිරීක්ෂණය වන අතර කොන්ත්‍රාත්තුව ලබාගත් කොන්ත්‍රාතකරුද මෙම අවශ්‍යතාවය සපුරා නොතිබුණු බැවින් මණ්ඩලයට **රු.1,070,000** ක පාඩුවක් සිදුවී තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරු රාජ්‍ය අංශයේ වෙනත් ආයතනයක් විසින් සංවිධානය කරන ලද මෙවැනි විශේෂ වැඩසටහනකට සහභාගි වී නොතිබූ හෙයින් හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නුවරඑළිය වසන්තයේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ ප්‍රචාරණ වැඩසටහන් සඳහා අවශ්‍ය තාක්ෂණික මෙවලම් එම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් යටතේ සපයා ගැනීමට ඇති හැකියාවන් පිළිබඳ නිශ්චිත තාවයක් නොතිබූ බැවින් අවසාන මොහොතේ එම තත්ත්වය මත ප්‍රචාරණ වැඩසටහනේ ගුණාත්මකභාවයට එයින් හානි සිදුවිය හැකි බව සලකා බැලූ තාක්ෂණික ඇගයිම් කමිටුව ඉතා අඩු කාලයත් තුළදී එනම් සති **2** කින් මෙම කටයුත්ත නිම කිරීමට ඔවුන්ට ඇති හැකියාව අල්ප යැයි හැඟී ගිය හෙයින් එම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට තීරණය කර ඇත. තවද විදේශීය සංචාරකයින් ඉලක්ක කර මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රවර්ධන වැඩසටහන් වලදී අවම මිල පමණක් නොව ගෙවන මිලට සැලකිය යුතු සෑහෙන වටිනාකමක් **(Value for Money )** සැමවිටම අපේක්ෂා කරන බව පෙන්වා දෙමි. | මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව පිරිවිතර පිළියෙල කර සියලුම ටෙන්ඩර්කරුවන්ගේ ලංසු සමාන පදනමක් මත ආයතනයට අවාසිදායක නොවන අයුරින් ඇගයීමට ලක් කළ යුතුය. |
| (ආ) වසර දෙකක කාලයක සිට පුද්ගලික තේ ඇසුරුම් කරන සමාගමකින් ලැබිය යුතු තොග ඌනතාවය **රු.534,604** ක් හා පළුදු වූ තේ ඇසුරුම් තොග සඳහා රු. **780,646** ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගෙන නොතිබුණි. | තොග ඌනතා සඳහා අයකර ගත යුතු **රු.534,604** ක මුදල තේ ඇසුරුම් ආයතනයට ගෙවන මුදලින් හිලවු කර ගැනීමට කටයුතු කරනු ලැබේ. පළුදු වූ ඇසුරුම්වල වටිනාකම වන **රු.780,646** ක මුදල අයකර ගැනීම පිණිස එම ආයතන සමඟ සාකච්ඡා කරමින් පවතී. | ප්‍රමාදයට හේතුව වහාම විමර්ශනය කර මෙම මුදල ගනුදෙනුකරුගෙන් හෝ වගකීම් පැහැර හරින ලද මණ්ඩලයේ නිලධාරියෙක් වේනම් ඒ අයගෙන් අයකළ යුතුය. |

**3.3** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ගම්පොළ ප්‍රාදේශීය කාර්යාලයට අයත් උඩුනුවර කොට්ඨාශයේ ලියාපදිංචි අංක RT 189 දරන කසළ තේ සැකසුම් මධ්‍යස්ථානයට මණ්ඩලය විසින් නිකුත් කරනලද කසළ තේ අවසරපත්‍රයන්හි දක්වා ඇති ගබඩා සඳහා උපරිම තේ කිලෝග්‍රෑම් 23,473 ක් වුවද එය ඉක්මවා කිලෝග්‍රෑම් 38,864 ක් වූ කසළ තේ තොගයක් ගබඩා කර තිබූ බව විගණනය විසින් තොග ආගණනය කිරීමේදී නිරීක්ෂණය විය. මෙම වරද සම්බන්ධයෙන් ගාස්තු අයකර වරද සමතයකට පත් කිරීමට විගණිත දිනය වූ 2020 මැයි 30 දින දක්වා කටයුතු කර නොතිබුණි. | අදාළ තේ තොගය මෙතෙක් නිදහස් කර නැති අතර තේ පාලන පනතේ විධිවිධාන වලට අනුව වරද සමතකිරීමේ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | තේ පාලන පනත අනුව වරද සමතකිරීමේ ගාස්තු කඩිනමින් අයකළ යුතුය. |
| (ආ)විගණනය විසින් නියැදි පරික්ෂාවට ලක්කරන ලද කසළ තේ සැකසුම් මධ්‍යස්ථානයන්හි කළු තේ ප්‍රමිතයට අනුකූල නොවන බව (Below Standard) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රසායනාගාරයේ ක්ෂුද්‍රජීවී විද්‍යාත්මක විශ්ලේෂණය අනුව නිරීක්ෂණය විය.දේශිය පරිභෝජනය සඳහා මෙම සැකසුම් තේ යොදාගන්නා නමුත් මණ්ඩලයේ අවධානය මේ පිළිබඳව යොමුවී නොතිබුණි. | පරීක්‍ෂණ අවස්ථාවේදී මෙම ස්ථානය වසා දමා තිබූ බැවින් පරීක්ෂණයට ලක්කළ නොහැකි බව තේ පරීක්ෂකගෙන් කරන ලද විමසීමට පිළිතුරු වශයෙන් දන්වා සිටියි. 2019 ඔක්තෝම්බර් 20 දින පරීක්ෂාකර මුද්‍රා තබා වෙලම්බොඩ පොලිස් ස්ථානය මගින් ගම්පොළ උසාවිය වෙත ඉදිරිපත් කර නඩු පවරා ඇත. එහි නඩු විභාගය 2019 ඔක්තෝම්බර්25 දින පැවති අතර තේ කොමසාරිස්ගේ අංක TC/STI/2014-78 සහ 2019ඔක්තෝම්බර්22 දිනැති ලිපියට එක් අයෙකුට රු.25,000 බැගින් දඩ මුදල් අයකර අපවිත්‍රකරණයට ලක් වූ තේ තොග 2019ඔක්තෝම්බර් 25 දින වි-ප්‍රකෘති කිරීමටත්ප්‍රමිතියෙන් යුත් තේ තොග ඔවුන් වෙත නිදහස් කිරීමටත් නියෝග කර ඇත. | කසළ තේ මධ්‍යස්ථානවල පවතින පරිභෝජනයට නුසුදුසු තේ තොග පිළිබඳව තේ පරීක්ෂකවරුන් අධීක්ෂණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80 අවම මිලක් පවත්වා ගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස බණ්ඩාරපොල තේ කර්මාන්තශාලාව සඳහා ලබා දී තිබූ රු.3,489,773ක මුදල දළු සැපයුම්කරුවන් වෙත ලබාදී නොතිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම මුදල ආපසු අයකර ගෙන නොතිබුණි. | 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80ක අවම මිලක් ගෙවීමේ වැඩසටහනට අනුව MF 0370 බණ්ඩාරපොල තේ කම්හල වෙත රු.3,489,773.00 ක් මුදලක් දළු සැපයුම්කරුවන් වෙත ගෙවීම සඳහා ලබා දී තිබූ අතර එම මුදල් නොගෙවීම හේතුකොටගෙන මණ්ඩලය විසින් සිදු කරන ලද පරීක්ෂණ පාදක කොට ගනිමින් ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය වංචා විමර්ශනය කිරීමේ අංශය හරහා අදාළ මුදල් අයකර ගැනීමට ගම්පොළ උසාවියේ අංක B 564/2017 යටතේ නඩුවක් ගොනුකර ඇත. | නඩු තීන්දුව අනුව අයවිය යුතු මුදල සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ඈ)කළුතර ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ඉඩම 2014 වර්ෂයේ සිට අවුරුදු 30 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමට බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් සමඟ බදු ගිවිසුමකට අත්සන් තබා නොතිබුණි. | බදුරලිය ප්‍රාදේශීය ලේකම්වරයා වෙත මෙම ඉඩම වෙනුවෙන් වාර්ෂිකව රු.300,000 බදු මුදලක් ගෙවන අතර අවසන් වශයෙන් 2019 වර්ෂය සඳහා 2019 ජූලි 22 දින බදු මුදල් ගෙවීම සිදුකර ඇති අතර එම දාතමින් ලිපියක් යවමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය නමින් මෙම ඉඩම සඳහා බදුකරය ලබාදෙන ලෙස ඉල්ලා ඇත. | දෙපාර්ශවය අතර බදු ගිවිසුමකට එළඹීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඉ) චීනයේ ඇති තේ ප්‍රවර්ධන ඒකකය සඳහා 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වාහනය වෙනුවෙන් චීන රජය මඟින් චීන තානාපති කාර්යාලය වෙත ආපසු ගෙවන ලද රු.889,870ක් (RMB 33 389.74) සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මණ්ඩලය වෙත ගෙන්වා ගෙන නොතිබුණි. | චීන තේ ප්‍රවර්ධන කාර්යාලය 2018 වර්ෂයේ මිලදී ගත් වාහනයට අදාළ වැට් බදු මුදල වන RMB 33,389.74ක මුදල චීන තේ ප්‍රවර්ධන කාර්යාලය විසින් විදේශ සබඳතා අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර ඇත. මෙම මුදල ලබාගැනීම සඳහා සිහිකැඳවීම් කිහිපයක් යැවූ නමුදු ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත එම මුදල ප්‍රේෂණය කර නොමැත. කෙසේ නමුදු කඩිනමින් මෙම මුදල ගෙන්වා ගැනීමට කටයුතු කරමි. | මණ්ඩලයට අයත් ආපසු ගෙවන ලද එකතු කළ අගය මත බදු මුදල කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ)මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.**211,115,401** ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබූ නුවරඑළිය, බණ්ඩාරවෙල, කළුතර හා රත්නපුර ප්‍රදේශයන්හි පිහිටි ඉඩම් **4** ක අයිතිය නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් දීර්ඝකාලීන බදු පදනම මත ලබාගෙන ඇති අතර එම ඉඩම්වල අයිතිය පැවරීමට හෝ බදුකර අත්සන් කිරීමට කටයුතු කරන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දිගින් දිගටම ඉල්ලීම් කළද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ යම් යම් ප්‍රමාදයන් මත එම කටයුතු නිමාවකට පත් වී නොමැත. කෙසේ වුවද ඉඩම්වල අයිතිය පවරා ගැනිමේ කටයුතු සඳහා නොකඩවා ඉල්ලීම් ඉදිරිපත් කරන බව සඳහන් කරමි. | ඉඩම් අයිතිය කඩිනමින් පවරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ)ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කරන ලද “ටී මෝමන්ට්ස්” නම්වූ තේ අලෙවි මධ්‍යස්ථානය ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක නොකිරීමෙන් රු.**62,603,006**ක අලාභයක් ඇතිවීම සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ **2016** දෙසැම්බර් **06** දිනැති සභාපති ඇමතූ ලිපිය මඟින් අපරීක්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරින්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් කර තිබුණද එය අභිබවා යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විනය ක්‍රියාමාර්ග ගැනීම නුසුදුසු බව තීරණය කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මඟින් තුරඟ තරඟ පිටියේ තේ අලෙවිසැල ආරම්භ කරන ලදී. එමගින් සිදු වූ අලාභය තේ මණ්ඩලයේ නිලධාරින්ගෙන් අයකර ගැනීමට නුසුදුසු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී. | අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ඌ)**2012** වර්ෂයේ සිරියාවේ පැවැත්වීමට සැලසුම්කර තිබූ “ ෆුඩ්එක්ස්පෝ සිරියා “ ප්‍රදර්ශනය සඳහා විදේශීය පුද්ගලික ආයතනයකට රු.**629,261** ක ගෙවීම්කර තිබුණි. එම ප්‍රදර්ශනය පැවැත්වීම අවලංගු කර තිබුණද, තවදුරටත් ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | **2012** වර්ෂයේ සිරියාවේ පැවැත්වීමට සැලසුම් කර තිබූ **“Foodexpo Siriya”** ප්‍රදර්ශනය එහි පැවති යුදමය තත්ත්වය මත අවලංගු කරන ලදී.මෙහිදී අත්තිකාරම් වශයෙන් ලබාදී තිබූ රු.**629,261** ක මුදල අයකර ගැනිමට ලිපි යැවූ නමුත් එහි ප්‍රගතියක් දක්නට නැත. මෙම කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර මෙම අයකරගත නොහැකි අත්තිකාරම් මුදල අලාභයක් ලෙස කපා හැරීමට ක්‍රියා කරනු ලැබේ. | ගෙවීම් කරන ලද මුදල අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතියකින් පොත්වලින් ලියාහැරීමට කටයුතු කළ යුතුය. |

**3.4** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂය අවසානයේදී මණ්ඩලයේ ලියාපදිංචි තේ කර්මාන්තශාලා 920 ක් පැවතියද ඉන් ක්‍රියාකාරී නොවන කර්මාන්තශාලා 190 ක් විය. ඒ අනුව ලියාපදිංචි තේ කර්මාන්තශාලාවලට සාපේක්ෂව ක්‍රියාකාරී නොවන කර්මාන්තශාලා සියයට 21 ක් වූ අතර ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනයද 2014 වර්ෂයේ සිටසමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව පහළ යමින් පැවතුණි. | විවිධ හේතූන් මත තේ කර්මාන්තශාලා අක්‍රියව පවතින අතර සමහර අවස්ථාවලදී තේ පාලන පනතේ විධි විධාන වලට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් ලියාපදිංචිය අත්හිටුවා ඇත. එමෙන්ම කාලගුණික හෝ දේශගුණික හේතු මත තේ නිෂ්පාදනය පහත වැටී ඇත. | මණ්ඩලය තේ කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස තේ කම්හල් වැසීයාම වැලැක්වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සංවර්ධන කාර්යයන් වැඩසටහන් 04ක් යටතේ ක්‍රියාත්මක කිරීමට රු.85,500,000 ක් වෙන්කර තිබුණු අතර තථ්‍ය වියදම රු.71,746,234 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| **i.** අදියර 5ක් යටතේ ගෙවන ලද තේ නැවත වගා සහනාධාර මුදලින් පළමු හා දෙවන අදියර සඳහා රු. 8,394,074 ක් සහනාධාර ලෙස ලබාගත් හෙක්ටයාර් 73.42 ක් හිමි ගොවීන් තේ නැවත වගාකිරීමට කටයුතු නොකිරීමෙන් එම සහනාධාර ලබාදීම මඟින් අපේක්ෂා කළ අරමුණ ඉටු වී නොතිබුණු අතර එම මුදල නැවත අයකර ගෙන නොතිබුණි. | අදියර 05 ක් යටතේ ගෙවන ලද තේ නැවත වගා සහනාධාර මුදලින් පළමු සහ දෙවන අදියර සඳහා රු.8,394,074 ක මුදලක් හෙක්ටයාර් 73.42 ක් සඳහා ගෙවීම් කළද ඉදිරි පියවරයන් පිළිබඳව පරීක්ෂණ සඳහා අදාළ ඉල්ලුම්කරුවන් තේ මණ්ඩලය වෙත දැනුම් දී නොතිබීම හේතුවෙන් ඒ සඳහා පරීක්ෂා කිරීමට නිලධාරීන් මෙහෙයවීමට කටයුතු කරන ලද අතර අදාළ ඉඩම් හිමියන් වෙත ලබාගත් මුදල වහාම ආපසු ගෙවන ලෙස දැනුම් දෙන ලදී. කෙසේ වෙතත් කඩිනමින් පරීක්ෂණ කටයුතු ආරම්භ කර වගා කර නොමැති නම් මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ඇත. | තේ නැවත වගා නොකළ ගොවීන් වගාවට යොමු කිරීමට හෝ නැවත මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| **ii.** සමාලෝචිත වර්ෂයේදී තේ නැවත වගා සහනාධාර ලෙස රු.25,560, 830 ක් ගෙවීම් කර හෙක්ටයාර | තේ මණ්ඩලයේ ප්‍රගති වාර්තාවන්ට අනුව තේ නැවත වගා කළ බව සඳහන්ව ඇති අතර මෙම එක් එක් ඉල්ලුම්පත්‍ර පරීක්ෂා කිරීමෙන් අනතුරුව විගණන වාර්තාවේ | විගණන නිරීක්ෂණ වලට පිළිගත හැකි ලෙස කඩිනම් |

| | | | |
|---|---|---|---|
| | 172.7 ක් තේ නැවත වගාකළ බව මණ්ඩලයේ ප්‍රගති වාර්තාවන්හි සඳහන් වුවද සත්‍ය වශයෙන් තේ නැවත වගාව සිදුකළ බිම් ප්‍රමාණය හෙක්ටයාර51.6 ක් පමණක් බව විගණනය විසින් රැස් කළ වාර්තා වලට අනුව නිරීක්ෂණය විය. | සඳහන් හෙක්ටයාර් 51.6 ප්‍රමාණය සම්බන්ධව කරුණු ඉදිරිපත් කළ හැකි වනු ඇත. | පිළිතුරු සැපයීමට ප්‍රමාණවත් දත්ත පද්ධතියක් පවත්වාගත යුතුය. |
| iii. | තේ නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ පළමු වාරික 2 සඳහා රු.480,000 ක් ප්‍රාදේශීය වැවිලි සමාගමකට මණ්ඩලය විසින් ගෙවීම් කර තිබුණද තේ නැවත වගා කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම මුදල අයකර ගැනීමෙන් තොරව නැවත එම තේ ඉඩම සඳහාම “මොඩල් ටී ගාර්ඩනින්“ වැඩසටහන යටතේ රු.550,000ක් තේ නැවත වගාව සඳහා ගෙවා තිබුණි. | තේ නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ පළමු අදියර 02 සඳහා හෙක්ටයාර් 04 ක් වෙනුවෙන් රු.480,000ක මුදලක් කැළණිවැලි වැවිලි සමාගම වෙත ගෙවා තිබුණි. මෙම කොටසෙන් අක්කරයක ප්‍රමාණයක් 2019 ආදර්ශ තේ වගා ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය ප්‍රදේශයේ ආදර්ශ වගාවක් වශයෙන් ඉතාම සුදුසු ස්ථානයක් වන මෙම ස්ථානය එම ක්ෂේත්‍රයටම ඉඩම සැකසීම සහ පස සංරක්ෂණය සඳහා ගෙවා ඇත. ඒ අනුව ඉඩමේ ඉතිරි හෙක්ටයාර් 3.5 ක ප්‍රමාණය නැවත වගාව සඳහා කටයුතු කරන බැවින් මෙම අක්කරයක කොටස වෙනුවෙන් ගෙවන ලද මුදල් ඉදිරි සහනාධාර වලදී අඩු කර ගැනීමට නියමිතය. | නව සහනාධාර ගෙවීම් කිරීමේදී පෙර ගෙවනලද සහනාධාර අපේක්ෂිත කාර්යය සඳහා යොදවා තිබේදැයි සලකා බැලිය යුතුය. |
| iv. | මණ්ඩලය විසින් තේ දළු වල තත්ත්ව ප්‍රමිතිය ඉහළ නංවා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් සඳහා රු.5,337,161 ක්ද යහපත් නිෂ්පාදන ක්‍රමවේද සඳහා රු.2,236,559 ක් ද වැයකර තිබුණි.වාර්ෂිකව මේ සඳහා වැයකරන මුදල වැඩිවෙමින් පැවතියද තේදළුවල ප්‍රමිතියෙහි සැලකිය යුතු වර්ධනයක් සිදුවී ඇති බව තහවුරු කර ගෙන නොතිබුණි. | පැවතුණු කාලගුණික තත්ත්වයන් සමඟ තේ දළු ගුණාත්මය වර්තමානයේ පවතින මට්ටමින් හෝ පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත්තේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන දළු ප්‍රමිතිය ඉහළ නංවා ගැනීමේ වැඩසටහන් හේතුවෙනි.වර්තමානයේ යහපත් නිෂ්පාදන ක්‍රමවේද උපායමාර්ගය යටතේ (GMP)“දුර්වල” ගණයේ කම්හල් ක්ෂේත්‍රයේ නොමැති අතර සාමාන්‍ය ගණයේ කම්හල් ඉතාම අතලොස්සක් පමණක් ඇත. විශිෂ්ට ගණයේ සහ හොඳ තත්ත්වයේ කම්හල් ප්‍රමාණය වැඩි වී ඇත. මෙම තත්ත්වය අත්කර ගෙන ඇත්තේ මණ්ඩලය විසින් දිගින් දිගටම ක්‍රියාත්මක කරනු ලබන යහපත් නිෂ්පාදන ක්‍රමවේද වැඩසටහන්මාලාව හේතුවෙනි. | තේ දළු වල තත්ත්ව ප්‍රමිතිය ඉහළ නංවා ගැනීම සඳහා වඩාත් සුදුසු උපායමාර්ග සඳහා මුදල් වැයකළ යුතුය. |

(ඇ) 2012 වර්ෂයේ සිට 2016 දක්වා වූ පස් අවුරුදු කාල පරිච්ඡේදය තුළ "ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම උදෙසා උපාය මාර්ගික සැලැස්මක්" ක්‍රියාත්මක කිරීම සඳහා 2011දෙසැම්බර් 01 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි.අපනයනකරුවන්ගෙන් රැස්කරගන්නා බදු මුදලින් අපේක්ෂිත ඉපැයීම් වලින් රු.බිලියන අටක් යොදවා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මෙම වැඩසටහන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

| | | |
|---|---|---|
| i. මෙම වැඩසටහනට අදාළ නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතු සිදුකිරීමට 2015 වර්ෂයේ නොවැම්බර් 06 සිට 2016 නොවැම්බර් 05 දින දක්වා වර්ෂයක කාලයක් සඳහා රු.328,423,200(USD 2260000) කට පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් ගතවී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.238,185,575 ක් ගෙවීම් කර තිබුණි.වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 04 ක් ඉක්ම ගියද අදාළ කාර්යයන් නිම කිරීමට නොහැකි වී තිබුණි. එමනිසා ඉහත ගිවිසුම අවස්ථා 03 කදී 2020 මැයි 05 දින දක්වා දීර්ඝ කර තිබුණි. එසේම රු.99,630,039 ක් වැය කර 2016 අප්‍රේල් මස මෙම වැඩසටහනට අදාළ රූපවාහිනී වෙළඳ දැන්වීම නිර්මාණය කර අවසන්ව | 2015 නොවැම්බර් 06 වන දින නිර්මාණාත්මක නිෂ්පාදන සඳහා Phoenix O&M ආයතනය සමඟ ගිවිසුම් ගතවුවද මාධ්‍ය මිලදී ගැනීම සඳහා උපදේශන සේවා ලබාගැනීමට ගිවිසුම් ගත වන්නේ 2018 මාර්තු 21 වන දින දීය. ඒ අනුව රු. 99,630,039 ක් වැය කර නිෂ්පාදනය කරන ලද රූපවාහිනි වෙළඳ දැන්වීමමාධ්‍ය විකාශනය සඳහා යොදා ගැනීමට ප්‍රමාද විය.ඒ නමුත් රුසියාවේ NTV ආයතනය සමඟ එකාබද්ධ කරන ලද තේ ප්‍රචාරණ වැඩසටහන් මාලාවේදී ඉහත සඳහන් වෙළඳ දැන්වීම NTV මාධ්‍ය හරහා විකාශනය කරන ලදී.<br>ඉහත ප්‍රමාදයන් හේතුකොට ගෙන Phoenix O&M ගිවිසුම වසර 04 කුත් මාස 06 දීර්ඝ කරන ලද අතර එහි සියලුම නිර්මාණාත්මක කටයුතු 2020 මැයි මස 05 වන දින අවසන් කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයට හැකියාව ලැබී ඇත. මෙම ගිවිසුම් තවදුරටත් දීර්ඝ නොකර 2020 මැයි 05 වන දින සිට මාස 03 ක කාලයක් ඇතුළත මෙම කාර්යයන් සියල්ලම සම්පූර්ණ කිරීමට Phoenix O&M ආයතනය හා ශ්‍රී ලංකා තේ මණ්ලඩය සමඟ එකඟ වීඇත. | ප්‍රවර්ධන කටයුතු වඩා ඵලදායී ප්‍රතිඵල ලබාගැනීමට සැලසුම් කළ කාලය තුළ අදාළ වැඩසටහන් විකාශය කරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වසර තුනක් ගතවුවද අපේක්ෂිත අයුරින් මාධ්‍යන්හි විකාශය කිරීමට වාර්තාවේ දින දක්වා නොහැකි වී තිබුණි. | | |
| **ii.** | මෙම වැඩසටහනට අදාළව 2019 සැප්තැම්බර් මස රුසියාවේ පුද්ගලික සමාගමක් වෙත රු.29,832,302 ක් ගෙවා රුසියාව සහ යුක්රේනය යන රටවල දී මාධ්‍ය සමුළුවක් පැවැත්වුවද ඊට සමගාමීව ප්‍රවර්ධන වැඩසටහනෙහි ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන රුසියාව හා යුක්රේනය යන රටවල්හි ආරම්භ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2019 වර්ෂයේ ලබාදෙන ලදී. ඒ අනුව මහජන සම්බන්ධතා ප්‍රචාරණ කටයුතු ප්‍රථමයෙන් ආරම්භ කිරීමට තීරණය කරන ලද අතර රුසියාව හා යුක්රේනය යන රටවල් තුළ මහජන සම්බන්ධතා කාර්යයන් කරගෙන යැම සඳහා අදාළ ටෙනඩර් පටිපාටිය මඟින් තෝරා ගැනීමේ කටයුතු 2019 අගෝස්තු 27 දින අවසන් වුවත් තෝරාගත් ඒජන්සියක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා අදාළ ගිවිසුම සඳහා අවශ්‍ය නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමතියේද ප්‍රමාදය හේතු කොටගෙන තෝරාගත් ඒජන්සිය සමඟ ගිවිසුම්ගත වීම ප්‍රමාද විය. රුසියාවේ හා යුක්රේනයේ පැවැත්වීමට සැලසුම් කරන ලද මාධ්‍ය හමුවක් ඉහත තෝරා ගන්නා ලද ඒජන්සි විසින් නිර්දේශ කරන ලද වැඩසටහනට අනුව යමින් ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හරහා ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන දියත් කිරීම රුසියාවේ සැප්තැම්බර් මස ආරම්භ කරන ලද අතර යුක්රේනයෙහි ඔක්තෝබර් මාසයේදී ආරම්භ කරන ලදී. ඉන්පසු සැලසුම් කරන ලද තේ රස බැලීමේ වැඩසටහන් පිළිබඳවත් වෙළඳසැල් තුළ ක්‍රියාත්මක කරනලදී.<br>නමුත් 2019 නොවැම්බර් මස 16 වන දිනට පසු නව පාලන අධිකාරියමඟින් මෙම වැඩසටහන නැවත සමාලෝචනය කිරීමට තීරණය කරන ලද අතර ඒ සඳහා යෝජිත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවල පළමු අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට 2020 ජනවාරි මස 3 වන දින යොමු කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඒ සඳහා ප්‍රචාරණ හා අලෙවිකරණ කමිටුවේ උපදෙස් ලබාගන්නා මෙන්දැනුම් දෙන ලදී. | වැඩසටහනේ ඵලදායීත්වය සමාලෝචනය කිරීමෙන් පසුව මුදල් වැය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | මෙම වැඩසටහනට අදාළව මාධ්‍ය සමීක්ෂණය මාධ්‍ය සැලැස්ම පිළියෙළ කිරීම හා මාධ්‍ය මිලදී ගැනීම ඉහළ පෙළ හා පහළ පෙළ **(Above the line & Below the line)** යන කාර්යයන් සම්බන්ධයෙන් **2018.03.21** දින සිට **2020. 03.20** දක්වා උපදේශන සේවා සැපයීම වෙනුවෙන් කොළඹ ප්‍රදේශයේ පුද්ගලික සමාගමක් සමඟ රු.**219,899,960** කට ගිවිසුම් ගතවී තිබුණි. ඒ අනුව අපේක්ෂිත රටවල් **12** සඳහා මාධ්‍ය සැලැස්ම පිළියෙළ කිරීම **2018** වර්ෂයේ සැප්තැම්බර් මස අවසන් වන විට සම්පූර්ණ කළයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රුසියාව සහ යුක්රේනය යන රටවල් සඳහා පමණක් මාධ්‍ය සැලසුම් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට මාධ්‍ය සමීක්ෂණ සහ මාධ්‍ය සැලැස්ම පිළියෙළ කිරීම සඳහා අයවැය ගත මුදල ඉක්මවා රු.**5,749,828**ක් වැය කර තිබුණි. | **2018** මාර්තු මස **21** වන දින මාධ්‍ය මිලදී ගැනීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම සඳහා **Dentsn Grant** ආයතනය සමඟ වසර 3කට ගිවිසුමකට එකඟ වූ අතර **Dentsn Grant** ආයතනය මාධ්‍ය සමීක්ෂණ රටවල් **12** සඳහා නිම කරන ලද අතර **2019** වන විට රටවල් **07** සඳහා මාධ්‍ය සැලසුම් සකස් කරන ලදී.නමුත් **2019** වර්ෂයේදී ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන දියත් කරනුයේ රුසියාව හා යුක්රේනයෙහි පමණි.ඒ අනුව එම මාධ්‍ය සැලසුම් සඳහා අදාළ ගෙවීම සිදුකරන ලදී. | වඩාත් ඵලදායී ප්‍රතිලාභ ලබා ගැනීමට සැලසුම්ගත කාලය තුළදී සැලසුම්ගත කාර්යයන් ඉටුකළයුතුය. |
| iv. | මෙම වැඩසටහනෙහි නිර්මාණාත්මක කටයුතු හා මාධ්‍ය කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව ඉහත පුද්ගලික සමාගම් **2** ක් වෙත ලබාදී තිබුණද වැඩසටහනෙහි කාර්යයන් ඉටු කිරීමට මණ්ඩලයේ ප්‍රවර්ධන ඒකකයට අමතරව නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත අලෙවිකරණ මඬුල්ලක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන | ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්මට අනුව ගෝලීය ප්‍රවර්ධන වැඩසටහනේ කටයුතු සඳහා **Marketing Cell** එකක් යෝජනා කරන ලදී.ඒ අනුව නිලධාරීන් **06** දෙනෙකුගේ කාර්යයන් නිර්ණය කරන ලද අතර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දෙන ලද්දේ නිලධාරීන් **04** දෙනෙකු සඳහාය.ඒ අනුව එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට දෙවරක්ම පුවත්පත් දැන්වීම් පලකරනු ලැබුවද අදාළ වැටුප්වල හා සුදුසුකම් අතර ඇති වෙළඳපල නොගැලපීම හේතු කොට ගෙන එම | විශේෂිත කාර්යය පැවරුම් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා නිලධාරීන් අදාළකාර්යය සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී ඒ සඳහා රු.5,128,926 ක් වැය කර තිබුණද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් අපේක්ෂිත කාර්යයන් ඉටු කරවා ගැනීමට නොහැකි වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට නොහැකි විය.ඒ අනුව කොන්ත්‍රාත් පදනම යටතේ අදාළ දැනුම ඇති නිලධාරීන් තිදෙනෙකු බඳවා ගන්නා ලදී.එමෙන්ම උපාය මාර්ගික සැලැස්මට අනුව මෙම ගෝලීය ප්‍රවර්ධන කාර්යයන් දැනට සේවයේ යෙදී සිටි තථ්‍ය ප්‍රවර්ධන අංශයේ කාර්යය මණ්ඩලයටකිරීමේ අපහසුතාවය පැහැදිලි කර ඇත. ඒ අනුව ගෝලීය ප්‍රවර්ධනය විශේෂිත වූ කාර්යය මණ්ඩලයකින් සිදුවිය යුතුය. | |
| v. | 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස සියයට 18 ක්ව පැවතියදී ඵලදායී ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත පස් අවුරුදු උපායමාර්ග වැඩසටහන සැලසුම් කිරිම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද පස් අවුරුදු කාල සීමාව ඉක්මවා වසර දෙකකුත් අවසන්ව පැවතියද මෙම සැලැස්ම කාර්යක්ෂමව ඉටු කිරීමට නොහැකි වී තිබුණි.මණ්ඩලය විසින් වාර්ෂිකව දරන ප්‍රවර්ධන වියදම් ඉහළ ගොස් තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ගෝලීය තේ වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ කොටස සියයට 15 දක්වා පහළ ගොස් ඇති බව ජාත්‍යන්තර තේ කමිටුවෙහි සංඛ්‍යානමය දත්ත අනුව නිරීක්ෂණය විය. | ගෝලීය වෙළඳපොල තුළශ්‍රී ලංකාවේ තේ සඳහා වන කොටස සියයට18සිට සියයට 15දක්වා පහළ යාම සැලකීමේදී ඊට සාපේක්ෂව ගෝලීය තේ නිෂ්පාදනය ද ඉහත අයුරින්ම ශ්‍රී ලංකා තේ වල නිෂ්පාදන කොටස 2011 දී සියයට 7ක්ව පැවතියද සාමාලෝචිත වර්ෂය වන විට එය සියයට5 ක් දක්වා පහළ බැස ඇත.<br>2011 වර්ෂයේ ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය මිලියන 327ක් වන අතර එම වර්ෂයේ මිලියන 322ක් අපනයනය කරන ලදී. එමෙන්ම සමාලෝචිත වර්ෂය සැලකිමේදී සිලෝන් තේ නිෂ්පාදනය මිලියන 300 ට පහත වැටී තිබුණද සිලෝන් තේ අපනයනය මිලියන 292 ක් වාර්තා විය. අදාළ වර්ෂයන් සැලකීමේදී අපනයන ප්‍රමාණය, නිෂ්පාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස සියයට 98වන අගයක් වාර්තා කරයි.ලෝක වෙළඳපොල තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිශතය අඩුවීම හේතු සාධක වන්නේ අප්‍රිකානු කලාපය තුළ තේ නිෂ්පාදනය හා අපනයනය ඉහළ යාම තුළින් ප්‍රතිශතයක් වශයෙන් අප්‍රිකානු කලාපයේ නියෝජනය ඉහළයාමය. | පවත්නා පාරිභෝගිකයන් රඳවා ගැනීම සහ නව පාරිභෝගිකයන් නැඹුරු කර ගැනීමට ප්‍රවර්ධන උපායමාර්ග සැලසුම්ගත කාලය තුළ ඉටුකළ යුතුය. |

**3.5** මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයට අයත් මෝටර් රථ දෙකක් ගිවිසුමකට එළඹීමකින් තොරව **2016** වර්ෂයේ සිට ජාතික වැව්ලි කළමණාකාරීත්ව ආයතනය වෙත ලබා දී තිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකරගත් පුද්ගලික කුලී රථ සඳහා රු.**3,013,106** ක් වැයකර තිබුණි. එසේ වුවද ජාතික වැව්ලි කළමණාකාරීත්ව ආයතනය රු.**898,250** ක් වැය කර මෙම වාහන අලුත්වැඩියා කර ඉතා හොඳ තත්ත්වයෙන් ධාවනයේ යොදවන බව විගණනයේදී නිරීක්ෂණය විය. එබැවින් මෙම වාහන අනාර්ථික බවට සමීක්ෂණ මණ්ඩලය විසින් කර ඇති නිර්දේශය මතභේදාත්මක කරුණක් බවද වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ. | මණ්ඩලයට අයත් ඩබල් කැබ් රථ **02** ක් තවදුරටත් අලුත්වැඩියා කර භාවිතාකිරීම අනාර්ථික ක්‍රියාවක් බවට තීරණය කළ අධ්‍යක්‍ෂ මණ්ඩලය **2016** වර්ෂයේදී මෙම ඩබල් කැබ් රථ **02** අපහරණය කිරීමට තීරණය කර ඒ අනුව කටයුතු කරමින් සිටියදී එම කැබ් රථ **02** ජාතික වැව්ලි කළමණාකරන ආයතනයේ පරිහරණය සඳහා ලබා දෙන ලෙස වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අප වෙත උපදෙස් දෙන ලදී.<br>ඒ අනුව එම වාහනය භාවිතා කිරීම සඳහා ලබා දීම හා ලබා ගැනීම සම්බන්ධයෙන් ආයතනදෙක විසින් වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් මත එකඟතාවයකට පත්ව ඇති බව සඳහන් කරමි.<br>සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන අවශ්‍යතා ඉටු කරවා ගැනීම සඳහා එම ඩබල් කැබ් රථ **02** කිසිසේත් භාවිතා කළ නොහැකිව තිබූ අතර පුද්ගලික කුලී රථ භාවිතා කරන ලද්දේ එම ඩබල් කැබ් රථ **02** භාවිතා නොකළ නිසා නොව තේ මණ්ඩලයේ නිලධාරීන්ගේ රාජකාරි ගමන් සඳහා ප්‍රමාණවත් භාවිතා කළ හැකි තත්ත්වයේ වාහන සංචිතයේ නොතිබූ බැවින් ඒ අනුව අවශ්‍ය වූ වෙනත් වාහන කුලියට ගැනීමට වේ. | මණ්ඩලයට අයත් සම්පත් වෙනත් ආයතනවලට නිදහස් නොකළ යුතුය. |

**3.6** අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **2015** වර්ෂයේ අමු තේ දළු සඳහා රු.**80** ක අවම මිලක් පවත්වා ගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.**6,738,000,000** ක් වූ සහනාධාර මුදලින් ඉතිරි රු.**912,229** ක් **2015** දෙසැම්බර් **31** දින සිට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.**6,738,000,000**සහනාධාර මුදලින් ඉතිරි රු.**912,229** මුදලක් තේ මණ්ඩල ගිණුමෙහි තවදුරටත් පවතී. මෙම මුදල රඳවා තබා ඇත්තේ විවිධ පැමිණිලි සහ ගැටළු හේතුවෙන් මේ දක්වා ගෙවා අවසන් කිරීමට නොහැකි වූ ග්‍රීන් හිල්ටොප් **MF 1399** සහ ගුරුගොඩැල්ල **MF 1196** හි දළු සැපයුම්කරුවන් වෙත ගෙවීම සඳහාය. | පරීක්ෂණ කටයුතු කඩිනම් කර ගෙවිය යුතු මුදල් ගෙවීමට හා ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7** ප්‍රසම්පාදන කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තේවල පවත්නා පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය කිරීම සඳහා රසායනාගාරයේ ස්ථාපිත කර තිබූ GCMS/MS යන්ත්‍රය අක්‍රියව පවතින බැවින් නව යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා 2018 හා 2019 වර්ෂයන්හි රු.50,000,000 ක් අයවැය මගින් ප්‍රතිපාදනය කර තිබුණද ප්‍රසම්පාදනය නිමකර නොතිබුණි. මේ නිසා රසායනාගාර ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 44 කින් පහළ ගොස් තිබුණි. | මෙම අයිතමය මිලදී ගැනීම සඳහා 2019 වර්ෂයේ සංශෝධිත අයවැය ලේඛණයට ප්‍රතිපාදන ඇතුළත් කර 2019 ජුනි 19 වන දින තාක්‍ෂණ ඇගයීම් කමිටුවක් පත්කරපිරිවිතර සකස් කර තාක්‍ෂණ ඇගයීම් කමිටු වාර්තාව 2019 ඔක්තෝම්බර් 10 වන දින ඉදිරිපත් කළ අතර ඒ අනුව 2019 ඔක්තෝම්බර් 16 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකර ලංසු කැඳවන ලදී. ඉදිරිපත් වූ ලංසු 3 හි සඳහන් පිරිවිතරයන් තාක්‍ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද පිරිවිතරයන් හා නොගැළපෙන බැවින් 2019 දෙසැම්බර් 02 දින අදාළ අයිතමය සඳහා නැවත ලංසු කැඳවීමට නිර්දේශ කර ඇත. කෙසේ වුවද, 2020 වර්ෂයේ අයවැය ලේඛණයට එය ඇතුළත් කර මිලදී ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. | මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදනයන් කාලීනව කළ යුතුය. |
| (ආ) මණ්ඩලයේ අභ්‍යන්තර තොග පාලන ක්‍රමවේදය විධිමත්ව පවත්වා ගැනීම සඳහා රු.3,000,000 ක් වූ පරිගණකගත ඉන්වෙන්ට්‍රි පාලන පද්ධතියක් නිර්මාණය කිරීම 2019 මැයි 10 දින කොළඹ ප්‍රදේශයේ පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ඒ අනුව සති 19ක කාලයක් තුළදී එය සම්පූර්ණ කළ යුතු වුවද විගණිත දිනය වූ 2020 මැයි 30 වන දින දක්වා එම කාර්යය නිමකර නොතිබුණි. | 2018 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව පිරිනැමූ අතර 2019 මැයි මාසය මැද වන විට තොග පාලන මෘදුකාංග පද්ධතිය සකස් කිරීම ආරම්භ කරන ලදී. අවශ්‍ය දත්ත ඇතුළත් කිරීමෙන් හා කාර්යය මණ්ඩල පුහුණුවීම්, තොරතුරු සැපයීම්, වැනි කරුණු සඳහා මාස 08 පමණ කාලයක් ගත විය. ඉන් අනතුරුව 2020 පෙබරවාරි මාසය වන විට එම තොග පාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කළද, මාර්තු මාසයේ ඇති වූ කොවිඩ් 19 උවදුර හේතුකොට ගෙන එම කටයුත්ත අවසන් කිරීමට නොහැකි විය. නමුත් 2020 ජුලි 31 දින විට මෙම පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | අභ්‍යන්තර තොග පාලන ක්‍රමවේද විධිමත්ව පවත්වාගැනීමට මෘදුකාංග පද්ධතිය කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) 2016 ඔක්තොම්බර් 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර 2018 වර්ෂයේ මේ සඳහා අයවැය මඟින් රු.260,200,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ කාර්යය ආරම්භකර නොතිබුණ අතර උපදේශක සේවා වෙනුවෙන් රු.885,000 ක් දරා තිබුණි. | තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්‍ෂණ පද්ධතියක් සකස් කිරීමට අදාළව තාක්‍ෂණ කමිටුවේ වාර්තාව 2019 ජුනි 07 දිනඅමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත භාරදෙන ලදී. එම කමිටුව මඟින් තීරණයක් ලබාදීමට ප්‍රමාද වූ අතර 2020 ජුනි06 දින ප්‍රසම්පාදන තීරණය ලබාදෙන ලදී. මේ වන විට ප්‍රසම්පාදන තීරණය සම්බන්ධයෙන් විරෝධතාවයන් දැක්වීමට අදාළ ලංසුකරුවන්ට අවස්ථාව ලබා දී ඇත. | ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදයකින් තොරව කාලීනව ඉටුකළ යුතුය. |

**3.8** මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන) තනතුරු දෙකක්ද සහකාර අධ්‍යක්ෂක (ප්‍රවර්ධන) තනතුරු හයක්ද අලෙවි ප්‍රවර්ධන නිලධාරී තනතුරු හතරක්ද පවතින අතර අලෙවි ප්‍රවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (අලෙවිකරණ) වශයෙන් නව තනතුරක් සඳහා ආයතනික අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණි. | මෙම තනතුර අලුතින් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබෙන බවත්, ඒ අනුව තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා කටයුතු කරන ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වන ලදී. ඒ අනුව එම තනතුර සඳහා බඳවාගැනීම් පටිපාටි සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අලෙවිකරණ) තනතුරක් ඇති කිරීමට අනුමත කර ඇති නිසා එම තනතුර සඳහා බඳවාගැනීම් පටිපාටියක් සකස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. මෙම තනතුර ඇති කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත්තේ අමාත්‍ය මණ්ඩලය විසින් බව දන්වමි. | මණ්ඩලයේ අවශ්‍යතාවය මත කාර්යය මණ්ඩලය අනුමත කරගැනීමට කටයුතු කළ යුතුය. |

**3.9** අය වැය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දී සන්නාම ප්‍රවර්ධන වැඩසටහන සඳහා රු.500,000,000 ක් හා තානාපති කාර්යාල සමඟ පවත්වනු ලබන වැඩසටහන් 20 ක ප්‍රවර්ධන කාර්යයන් සඳහා රු.30,000,000 ක් ද වශයෙන් ප්‍රතිපාදන සිදුකර තිබුණද සන්නාම ප්‍රවර්ධන වැඩසටහනෙහි සැලසුම අනුව කිසිදු මූල්‍ය අවශ්‍යතාවයක් 2019 වර්ෂය සඳහා නොතිබූ අතර තානාපති කාර්යාල සමඟ පවත්වනු ලබන වැඩසටහන් 05 ක් සඳහා පමණක් රු.997,377 ක් පමණක් වැය කර තිබුණි. එමනිසා අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් තොරව අයවැය ප්‍රතිපාදනය කර තිබූ බව නිරීක්ෂණය විය. | 2018/2019 වර්ෂයේ සන්නාම ප්‍රවර්ධන ක්‍රමවේදය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී.ඒ අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා තේ අපනයනකරුවන් අතර ගිවිසුම් ආරම්භ කරනුයේ 2019 මුල් භාගයේ සිටය.එම නිසා ප්‍රථමයෙන් ගිවිසුම් ගත වූ අපනයනකරුවන්ගේද ගිවිසුම් අවසන් වන්නේ 2019 දෙසැම්බර් මස 31 වන දිනට වන අතර මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම ආරම්භ වන්නේ 2020 වර්ෂයේදීය.එම නිසා වෙන්කරන ලද මූල්‍ය සම්පත් පරිහරණයක් සිදුනොවන්නේ නමුත් 2019 වර්ෂයට අදාළ අයවැය අමාත්‍යාංශය වෙත ලබා දෙන්නේ 2018 ජූනි මස වන අතර එහි මෙම ප්‍රමාදයන් හඳුනාගැනීමට අපහසු වේ. | සංශෝධිත අයවැය පිළියෙල කිරීමේදී පසුව හඳුනාගන්නා ලද විචලනයන් ඇතුළත් කළ යුතුයි. |